DOI : 10.31357/fhssmst.1998.00687

# ශ්‍රී ලංකාවේ සමාජ ආරක්ෂණ වැඩසටහන්
# සහ
# ග්‍රාමීය කුටුම්බවල පූර්ව ආරක්ෂණ ඉතුරුම්

එම්. එම්. ගුණතිලක

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි පීඨයේ ශාස්ත්‍රපති (ආර්ථික විද්‍යා) උපාධි පරීක්ෂණයේ පාර්ශවීය අවශ්‍යතාවක් සම්පූර්ණ කිරීම සඳහා ඉදිරිපත් කෙරෙන පර්යේෂණ නිබන්ධයකි.

ලි.ප. අංකය : A 16739

විභාග අංකය : S.P.A. 412

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
1998 - මාර්තු

# Social Safety Net
# and
# Precautionary Savings Among Rural Households in Sri Lanka

**M. M. Gunatilake**

A dissertation submitted to the Faculty of Postgraduate, University of Sri Jayewardenepura, Sri Lanka in partial fulfillment of the requirement for the degree of master of arts (Economics)

| | | |
|---|---|---|
| Registration No. | : | A 16739 |
| Index No. | : | S. P. A. 412 |

**University of Sri Jayewardenepura, Sri Lanka**
**March - 1998**

# අයදුම්කරුගේ ප්‍රකාශය

මෙම පර්යේෂණ නිබන්ධය ශාස්ත්‍රපති (ආර්ථික විද්‍යා) උපාධි පරීක්ෂණයේ පාර්ශ්වීය අවශ්‍යතාවක් සම්පූර්ණ කිරීම සඳහා සකස් වූවකි.ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා අධ්‍යයන අංශයේ ආචාර්ය ජී. ඒ. උපාලි වික්‍රමසිංහ මහතාගේ අධීක්ෂණය යටතේ සම්පාදනය කරන ලද මෙහි අන්තර්ගත සෑම දත්තයක් හා මූලාශ්‍රයක්ම ග්‍රන්ථ, සඟරා පරිශීලනය කිරීමෙන් හා නියැදි සමීක්ෂණයකින් ලබාගත් බවත්, මෙය මින් පෙර කිසිදු පශ්චාද් උපාධියක් සඳහා ඉදිරිපත් නොකරන ලද බවත් මෙයින් සහතික කර සිටිමි.

එම්. එම්. ගුණතිලක

## උපදේශකවරයාගේ ප්‍රකාශය

අයදුම්කරුගේ ඉහත ප්‍රකාශය සත්‍ය බවත්, ඇගයීම් කටයුතු පිණිස මෙම පර්යේෂණ නිබන්ධය විශ්වවිද්‍යාලය වෙත භාරදීම සඳහා සුදුසු තත්ත්වයක පවතින බවත් නිර්දේශ කරමි.

Upali W Sinha

ආචාර්ය ජී.ඒ. උපාලි වික්‍රමසිංහ

# පටුන


| | පිටුව |
|---|---|
| පටුන | iv |
| වගු පටුන | vii |
| රූපසටහන් පටුන | ix |
| ඇමුණුම් ලේඛණය | x |
| උපකාරානුස්මෘති | xi |
| සම්පිණ්ඩනය | xii |
| 1. හැඳින්වීම | 01 |
| 1.1 අධ්‍යයනයේ පසුබිම | 01 |
| 1.2 අධ්‍යයන ගැටලුව | 05 |
| 1.3 අධ්‍යයනයේ අරමුණු | 05 |
| 1.4 පර්යේෂණ ක්‍රමවේදය | 06 |
| 1.4.1 ග්‍රාමීය අංශය සහ සමාජ ආරක්ෂණ වැඩසටහන් නිර්වචනය කිරීම | 06 |
| 1.4.2 නියැදිය තේරීම | 06 |
| 1.4.3 දත්ත රැස්කිරීමේ ක්‍රම හා දත්ත මූලාශ්‍ර | 09 |
| 1.4.4 දත්තවල විශ්වාසදායී බව | 10 |
| 1.4.5 දත්ත ඉදිරිපත් කිරීම හා විශ්ලේෂණ ක්‍රම | 10 |
| 1.5 පරිච්ජේද සංවිධානය | 11 |
| 1.6 අධ්‍යයනයේ වැදගත්කම | 11 |
| 1.7 අධ්‍යයනයේ සීමාවන් | 12 |
| 2. න්‍යායාත්මක පසුබිම | 13 |
| 2.1 හැඳින්වීම | 13 |
| 2.2 ඉතුරුම් නිර්වචනය කිරීම | 13 |
| 2.3 ආර්ථික ක්‍රමයක ඉතුරුම් ව්‍යුහය | 14 |
| 2.4 ආර්ථික ක්‍රමයක ඉතුරුම්, ආයෝජන සහ ආර්ථික වෘද්ධිය අතර පවතින සම්බන්ධතාව | 15 |
| 2.5 කුටුම්බ ඉතුරුම් පිළිබඳව ඉදිරිපත් වී ඇති ප්‍රධාන න්‍යායන් | 19 |
| 2.5.1 කේන්සියානු පූර්ණ ආදායම් කල්පිතය | 20 |
| 2.5.2 සාපේක්ෂ ආදායම් කල්පිතය | 21 |
| 2.5.3 ස්ථාවර ආදායම් කල්පිතය | 22 |
| 2.5.4 පන්ති ඉතුරුම් න්‍යාය | 24 |
| 2.5.5 ඉතිරිකිරීම් පිළිබඳ ජීවන චක්‍ර කල්පිතය | 24 |
| 2.6 සමාජ ආරක්ෂණය සහ කුටුම්බ ඉතුරුම් | 31 |
| 2.7 පෞද්ගලික ඉතුරුම් සඳහා බලපාන සාධක හඳුනාගැනීම | 32 |
| 2.7.1 අවිනිශ්චිතතාව | 33 |
| 2.7.2 ණය ලබාගැනීමේදී පවත්නා සංරෝධක | 34 |
| 2.7.3 පවුල සහ ඉතිරිකිරීම් | 36 |

පිටුව

2.7.4 අධ්‍යාපනය සහ ඉතිරිකිරීම් 36

2.8 නිගමන 37

3. ශ්‍රී ලංකාවේ සමාජ ආරක්ෂණ වැඩසටහන් 39

3.1 හැඳින්වීම 39

3.2 ශ්‍රී ලංකාවේ සමාජ ආරක්ෂණ පිරිවැය 39

3.2.1 සෞඛ්‍ය සේවාව 40

3.2.2 අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහා හඳුන්වා දී ඇති විශේෂ වැඩසටහන් 43

3.2.3 ආහාර සහනාධාරය 46

3.2.4 ආදායම් ආධාරක යෝජනා ක්‍රමය 49

3.2.5 ජනසවිය වැඩසටහන 50

3.2.6 සමෘද්ධි වැඩසටහන 51

3.3 සාරාංශය 54

4. සමාජ ආරක්ෂණය සහ කුටුම්බවල පූර්ව ආරක්ෂණ ඉතුරුම් 56

4.1 හැඳින්වීම 56

4.2 නියැදි සමීක්ෂණ ප්‍රදේශය 56

4.3 සමීක්ෂණ ප්‍රදේශයන්හි ග්‍රාමීය කුටුම්බ පිළිබඳ සමාජ-ආර්ථික විශ්ලේෂණය 57

4.3.1 ආදායම් මූලාශ්‍ර 57

4.3.2 අධ්‍යාපනය 58

4.3.3 මූල්‍ය ඉතුරුම් 59

4.3.4 පූර්ව ආරක්ෂණ ඉතුරුම් මාධ්‍යයක් ලෙස ස්වර්ණාභරණ 62

4.4 සමාජ ආරක්ෂණය හා කුටුම්බවල පූර්ව ආරක්ෂණ ඉතුරුම් 65

4.4.1 අපේක්ෂිත තත්ත්වය 65

4.4.2 පරීක්ෂණ ක්‍රමවේදය 65

4.4.3 සමාජ ආරක්ෂණය සහ කුටුම්බවල පූර්ව ආරක්ෂණ ඉතුරුම් 65

4.4.3.1 කල්පිත පරීක්ෂාව I 68

4.4.3.2 කල්පිත පරීක්ෂාව II 69

4.4.3.3 සමාජ ආරක්ෂණය සහ කුටුම්බවල පූර්ව ආරක්ෂණ ඉතුරුම් අතර ස්වායත්තතා පරීක්ෂාව 72

4.4.3.4. පූර්ව ආරක්ෂණ ඉතුරුම් සහ රජයේ සමාජ ආරක්ෂණය පිළිබඳ ප්‍රතිපායන විශ්ලේෂණය 74

4.4.3.5 කුටුම්බවල පූර්ව ආරක්ෂණ ඉතුරුම් හැසිරීම : නිදර්ශන අධ්‍යයන 75

4.4.3.5.1 ගම්පහ දිසත්‍රික්කය 75

4.4.3.5.2 පොළොන්නරුව දිසත්‍රික්කය 77

4.4.3.5.2 කුරුණෑගල දිසත්‍රික්කය 79

4.4.4 ණය සංරෝධක සහ පූර්ව ආරක්ෂණ ඉතුරුම් 81

4.5 නිගමන 83

| | පිටුව |
|---|---|
| 5. සමාලෝචනය, නිගමන සහ යෝජනා | 85 |
| 5.1 සමාලෝචනය | 85 |
| 5.2 නිගමන | 89 |
| 5.3 යෝජනා | 89 |
| 5.4 වැඩිදුර පර්යේෂණ | 90 |

ග්‍රන්ථනාමාවලිය

ඇමුණුම්

# වගු පටුන


| වගු අංකය | | පිටුව |
|---|---|---|
| 1.1 | තෝරාගත් රටවල් කිහිපයක දළ දේශීය ඉතුරුම් අනුපාතයන් | 2 |
| 1.2 | අධ්‍යයනය සඳහා තෝරාගන්නා ලද දිස්ත්‍රික්කවල ජනසවි සහ සමෘද්ධිලාභී කුටුම්බ ප්‍රතිශතය | 8 |
| 1.3 | නියදිය තෝරාගැනීම | 9 |
| 3.1 | ශ්‍රී ලංකාවේ ප්‍රධානතම සමාජ ආරක්ෂණ වැඩසටහන්වල වාර්ෂික පිරිවැය 1949 - 1995 | 41 |
| 3.2 | ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සේවාව | 42 |
| 3.3 | ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය | 44 |
| 3.4 | අධ්‍යාපන ක්ෂේත්‍රයට සම්බන්ධ විශේෂ සහනාධාර වැඩසටහන්වල මෑතකාලීන පිරිවැය තත්ත්වය | 45 |
| 3.5 | ශ්‍රී ලංකාවේ ආහාර සහනාධාරය සඳහා දරන ලද පිරිවැය | 47 |
| 3.6 | 1979 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක අනුව ආහාර මුද්දරලාභීන්ගේ ප්‍රමාණය සහ ව්‍යාප්තිය | 48 |
| 3.7 | ජනසවිය වැඩසටහන සඳහා වාර්ෂික පිරිවැය 1989 - 1994 | 51 |
| 3.8 | ශ්‍රී ලංකාවේ ජනසවි සහ සමෘද්ධිලාභී කුටුම්බ ව්‍යාප්තිය දිස්ත්‍රික්ක අනුව 1996 අප්‍රේල්/ජූනි | 53 |
| 4.1 | තෝරාගන්නා ලද කුටුම්බ නියැදියේ ප්‍රධාන ආදායම් මූලාශ්‍ර | 57 |
| 4.2 | ගෘහමූලිකයන්ගේ අධ්‍යාපන මට්ටම | 59 |
| 4.3 | රාජ්‍ය සහනාධාර ලබන කුටුම්බවල මූල්‍ය ඉතුරුම් | 61 |
| 4.4 | රාජ්‍ය සහනාධාර නොලබන කුටුම්බවල මූල්‍ය ඉතුරුම් | 61 |
| 4.5 | සමාජ ආරක්ෂණ වැඩසටහන් මගින් ආධාර ලබන කුටුම්බ සතු ස්වර්ණාභරණවල වටිනාකම | 63 |

4.6 සමාජ ආරක්ෂණ වැඩසටහන් මගින් ආධාර නොලබන කුටුම්බ සතු ස්වර්ණාභරණවල වටිනාකම 64

4.7 රජයේ සමාජ ආරක්ෂණ වැඩසටහන් මගින් රැකවරණය ලබන කුටුම්බවල දුවශීල වත්කම් දර්ශකය 67

4.8 රජයේ සමාජ ආරක්ෂණ වැඩසටහන් මගින් රැකවරණය නොලබන කුටුම්බවල දුවශීල වත්කම් දර්ශකය 67

4.9 රජයේ සමාජ ආරක්ෂණ වැඩසටහන් මගින් රැකවරණය ලබන කුටුම්බවල දුවශීල ඉතුරුම් දර්ශකය 70

4.10 රජයේ සමාජ ආරක්ෂණ වැඩසටහන් මගින් රැකවරණය නොලබන කුටුම්බවල දුවශීල ඉතුරුම් දර්ශකය 70

4.11 ස්වායත්තතා පරීක්ෂාව සඳහා නිරීක්ෂිත අගයන් 73

4.12 ස්වායත්තතා පරීක්ෂාව සඳහා අපේක්ෂිත අගයන් 73

4.13 තෝරාගන්නා ලද කුටුම්බවල මූල්‍ය සහ මූර්ත ඉතුරුම් ගම්පහ දිස්ත්‍රික්කය 76

4.14 තෝරාගන්නා ලද කුටුම්බවල මූල්‍ය සහ මූර්ත ඉතුරුම් පොලොන්නරුව දිස්ත්‍රික්කය 77

4.15 තෝරාගන්නා ලද කුටුම්බවල මූල්‍ය සහ මූර්ත ඉතුරුම් කුරුණෑගල දිස්ත්‍රික්කය 79

4.16 ණය සංරෝධක සහ පූර්ව ආරක්ෂණ ඉතුරුම් පිළිබඳ නිරීක්ෂිත අගයන් 81

4.17 ණය සංරෝධක සහ පූර්ව ආරක්ෂණ ඉතුරුම් පිළිබඳ අපේක්ෂිට අගයන් 82

4.18 ග්‍රාමීය කුටුම්බවල ප්‍රධාන ණය මූලාශ්‍ර 83

## රූපසටහන් පටුන


| රූපසටහන | | පිටුව |
|---|---|---|
| 2.1 | ආර්ථික ක්‍රමයක ඉතුරුම් ව්‍යුහය | 14 |
| 2.2 | කේන්සියානු න්‍යාය සහ ඩූසෙන්බරිගේ න්‍යාය අතර සම්බන්ධය | 21 |
| 2.3 | ඉතුරුම් පිළිබඳ ජීවන චක්‍ර කල්පිතය | 25 |
| 2.4 | පුද්ගලයෙකුගේ ආයුකාලය අනුව පරිභෝජනය, ඉපැයීම් සහ ධනය යන විචල්‍යයන්ගේ හැසිරීම | 26 |
| 4.1 | කුටුම්බ කණ්ඩායම් දෙකෙහි මූල්‍ය ඉතුරුම්වල ව්‍යාප්තිය | 62 |
| 4.2 | කුටුම්බ කණ්ඩායම් දෙකෙහි ස්වර්ණාභරණ හිමිකමේ ව්‍යාප්තිය | 64 |
| 4.3 | ගම්පහ දිස්ත්‍රික්කයෙන් තෝරාගන්නා ලද කුටුම්බ දෙකෙහි මූල්‍ය සහ මූර්ත ඉතුරුම් ක්‍රියාකාරකම් | 76 |
| 4.4 | පොළොන්නරුව දිස්ත්‍රික්කයෙන් තෝරාගන්නා ලද කුටුම්බ දෙකෙහි මූල්‍ය සහ මූර්ත ඉතුරුම් ක්‍රියාකාරකම් | 78 |
| 4.5 | කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් තෝරාගන්නා ලද කුටුම්බ දෙකෙහි මූල්‍ය සහ මූර්ත ඉතුරුම් ක්‍රියාකාරකම් | 79 |

## ඇමුණුම් ලේඛණය


| ඇමුණුම් අංකය | | පිටුව |
|---|---|---|
| 1. | නියැදි සමීක්ෂණය සඳහා භාවිත කල ප්‍රශ්ණාවලිය | 98 |
| 2. | ද්‍රවශීල වත්කම් දර්ශකය සකස්කිරීම | 107 |
| 3. | ද්‍රවශීල වත්කම් දර්ශකය ගණනය කිරීම සහ ඒ සඳහා භාවිත කල දත්ත | 109 |
| 4. | කල්පිත පරීක්ෂාව I සඳහා ප්‍රමත අගය ගණනය කිරීම | 115 |
| 5. | ද්‍රවශීල ඉතුරුම් දර්ශකය සහ එය ගණනය කිරීමට භාවිත කල දත්ත | 116 |
| 6. | කල්පිත පරීක්ෂාව II සඳහා ප්‍රමත අගය ගණනය කිරීම | 123 |
| 7. | කයි වර්ගය ගණනය කිරීම | 124 |
| 8. | ප්‍රතිපායන ප්‍රතිඵල සටහන | 125 |
| 9. | කයි වර්ගය ගණනය කිරීම | 126 |

# උපකාරානුස්මෘති

අධ්‍යයන කටයුතු සඳහා නිරන්තරයෙන් අපව දිරිමත් කරන කැලණිය විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යාව පිළිබඳ මහාචාර්ය කේ. ධර්මසේන මහතා ඇතුළු ආචාර්ය මණ්ඩලය මෙහිදී සිහිපත් කළ යුතුය.

මෙවැනි අධ්‍යයනයක් සඳහා සුදුසු පර්යේෂණ ක්ෂේත්‍රයක් තෝරාගැනීම, පර්යේෂණ සැලැස්ම සකස් කිරීම යනාදී කටයුතුවලදී උපදෙස් සපයන ලද ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වර්තමාන උපකුලපතිතුමා වන මහාචාර්ය පි.විල්සන් මහතාටත්, පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ පීඨාධිපතිතුමා වන මහාචාර්ය මාකස් කරුණානායක මහතාටත්, සමාජ සංඛ්‍යානය පිළිබඳ මහාචාර්ය ඩබ්.ඒ ජයතිස්ස මහතාටත් මාගේ ගෞරවණීය ස්තුතිය හිමිවේ.

මෙම පර්යේෂණ නිබන්ධයේ වැඩකටයුතුවල ආරම්භයේ සිටම සිය කාලය කැප කරමින් එහි සියළු කටයුතු සාර්ථකව නිම කරගැනීම සඳහා මාර්ගෝපදේශකත්වය සැපයූ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා අංශයේ වර්තමාන අංශාධිපති ආචාර්ය ජි. ඒ උපාලි වික්‍රමසිංහ මහතාට මාගේ කෘතඥතා පූර්වක ස්තුතිය හිමිවේ.

මෙම නිබන්ධයේ පරිගණක මුද්‍රණ කටයුතු සඳහා තමන්ගේ පෞද්ගලික පරිගණකය ලබාදීමෙන් සහ හැකි සෑම අයුරකින්ම උදව් උපකාර කළ කැලණිය විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආර්යවංශ දිසානායක මහතාටත්, තන් අයුරින් උදව් උපකාර කළ කථිකාචාරිණී ලක්දිනී සෙනෙවිරත්න මහත්මියට සහ කථිකාචාර්ය අජිත් දිසානායක මහතාටත් මාගේ කෘතඥතාවය හිමිවේ.

එමෙන්ම මෙම නිබන්ධයේ පරිගණක මුද්‍රණ කටයුතු ඉතාමත් සාර්ථක අන්දමින් නිමකරදුන් මා මිත්‍ර බන්දුල අටුපොලගේ මහතාටද මාගේ ස්තුතිය පුදකරනු කැමැත්තෙමි.

# ශ්‍රී ලංකාවේ සමාජ ආරක්ෂණ වැඩසටහන් සහ ග්‍රාමීය කුටුම්බවල පූර්ව ආරක්ෂණ ඉතුරුම්

එම්.එම්.ගුණතිලක


## සම්පිණ්ඩනය

ශ්‍රී ලංකාවට අවශ්‍ය ආයෝජන සම්පත් දේශීය වශයෙන් සපුරා ගැනීමට හැකියාවක් පවතී නම් එය තිරසාර (Sustainable) ආර්ථික වර්ධනයකට හේතුවන බව පැහැදිලි කරුණකි. ඒ සඳහා දේශීය වශයෙන් මූල්‍ය සම්පත්වල වර්ධනයක් සිදුවිය යුතුය. ශ්‍රී ලංකාවේ දේශීය ඉතුරුම් තීරණයවීමේදී ඒ සඳහා දායක වන රාජ්‍ය, ව්‍යවසායක හා කුටුම්බ යන අංශ අතරින් කුටුම්බ අංශයේ ක්‍රියාකාරිත්වය වඩාත් කැපී පෙනේ.

ශ්‍රී ලංකාවේ කුටුම්බ අංශය ග්‍රාමීය, නාගරික හා වතු යන උප අංශ තුනකින් සමන්විත වේ. නමුත් ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 70% ක් පමණ වාසය කරනුයේ ග්‍රාමීය ප්‍රදේශවලය. එබැවින් ශ්‍රී ලංකාවේ ග්‍රාමීය කුටුම්බ අංශය සාපේක්ෂ වශයෙන් විශාලතම අංශය ලෙස හැඳින්විය හැකිය. එම නිසා ශ්‍රී ලංකාවේ දේශීය ඉතුරුම් වර්ධනය කරගැනීම සඳහා දරනු ලබන උත්සාහයකදී ග්‍රාමීය කුටුම්බ අංශය කෙරෙහි විශේෂ අවධානයක් යොමුකිරීම වැදගත් වේ.

ශ්‍රී ලංකාවේ ඉතා විශාල පරාසයක් තුළ ක්‍රියාත්මක වන සමාජ ආරක්ෂණ වැඩසටහන් ජාලයක් පවතී. මේ සඳහා වාර්ෂිකව විශාල පිරිවැයක් රජය විසින් දරනු ලැබේ. 1996 වර්ෂයේදී කුටුම්බ වෙත සපයන ලද සෘජු සහනාධාර සඳහා රු.ද.ල. 12,735 ක පිරිවැයක් රජයට දැරීමට සිදුවීමෙන් ඒ බව වඩාත් තහවුරු වේ. ශ්‍රී ලංකාවේ සමාජ ආරක්ෂණ වැඩසටහන් ජාලය මගින් රැකවරණය ලබන කුටුම්බ අතර වැඩි ප්‍රතිශතයක් හිමිකරගනු ලබන්නේ ග්‍රාමීය කුටුම්බ විසිනි.

නමුත් සමාජ ආරක්ෂණය සහ කුටුම්බවල පූර්ව ආරක්ෂණ ඉතුරුම් අතර සහ-සම්බන්ධතාවක් පවතින බවට අදහසක් පවතී. විශේෂයෙන්ම සමාජ ආරක්ෂණය කුටුම්බවල පූර්ව ආරක්ෂණ ඉතුරුම් අඩුකිරීමකට හේතුවන බවට මතයක් පවතී. එසේවුවත් මේ පිළිබඳව විමසාබැලීම සඳහා ශ්‍රී ලංකාව විෂයෙහි සිදුකරන ලද අධ්‍යයනයක් නොමැති තරම්ය. එබැවින් ශ්‍රී ලංකාවේ ග්‍රාමීය කුටුම්බවල පූර්ව ආරක්ෂණ ඉතුරුම් සහ රජයේ සමාජ ආරක්ෂණ වැඩසටහන් අතර කිසියම් සම්බන්ධතාවක් පවතීද යන්න හඳුනාගැනීමට මෙම අධ්‍යයනය තුළින් උත්සහ දරන ලදී. ඒ අනුව නියැදි සමීක්ෂණයක් මගින් රැස්කරණ ලද දත්ත විශ්ලේෂණය කිරීමේදී හෙළිවූයේ ශ්‍රී ලංකාවේ ග්‍රාමීය කුටුම්බවල පූර්ව ආරක්ෂණ ඉතුරුම් සහ රජයේ සමාජ ආරක්ෂණ වැඩසටහන් අතර සහ-සම්බන්ධතාවක් නොමැති බවය.

## 1.  හැඳින්වීම

### 1.1 අධ්‍යයනයේ පසුබිම

ශ්‍රී ලංකාවේ සංවර්ධන ප්‍රයත්නය සාර්ථක කර ගැනීම උදෙසා අනුගමනය කළ හැකි ක්‍රමෝපායන් මොනවාද යන්න පිළිබඳව දැඩි අවධානයක් යොමු කිරීම කාලීන අවශ්‍යතාවකි. ඕනෑම රටක ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේදී මූර්ත දළ ජාතික නිෂ්පාදිතයේ වර්ධනයක් සිදුවීම පූර්ව අවශ්‍යතාවයක් වන අතර ආර්ථික වෘද්ධියක් සඳහා ඉටුවිය යුතු කොන්දේසි අතර ආර්ථිකයේ සිදුවන ආයෝජන ප්‍රමාණයේ වර්ධනයක් අනිවාර්යයෙන්ම සිදුවිය යුතු බව මෙතෙක් ඉදිරිපත් වී ඇති බොහෝ වෘද්ධි න්‍යායයන් මගින් අවධාරණය කොට ඇත.[1]

අර්ථ ක්‍රමයක ආයෝජන ප්‍රමාණය වර්ධනය කර ගැනීම විෂයෙහි තෝරාගත හැකි ප්‍රධාන මාර්ගයන් දෙකක් පවතී. එනම් දේශීය හා විදේශීය යන වශයෙනි. නමුත් විදේශීය ආයෝජන මූලාශ්‍රය වෙත කිසියම් රටක් දැඩි රැඳියාවක් පැවැත්වීමේ අහිතකර ප්‍රතිවිපාක පවත්නා බැවින් දිගුකාලීනව පවත්වාගෙන යා හැකි තිරසාර ආර්ථික වෘද්ධියක් සඳහා වඩාත් වැදගත් වන්නේ දේශීය ආයෝජන වල සිදුවන වර්ධනයකි. රටක දේශීය ආයෝජන ප්‍රමාණයේ වර්ධනය වීම සඳහා එම රටෙහි 'ඉතුරුම්' වර්ධනය වීම පූර්ව අවශ්‍යතාවයකි. මෙහිදී වඩාත් විශ්වාසදායි ලෙස හා පවත්වාගෙන යා හැකි ලෙස (Reliable and Sustainable) දේශීය ආයෝජන වල වර්ධනයක් සිදුවීමකට වඩාත් වැදගත් වන්නේ දේශීය ඉතුරුම්වල සිදුවන වර්ධනයකි (Fernando, 1991, p.1).

ආර්ථික ක්‍රමයක ඉතුරුම් සහ ආර්ථික වර්ධනය අතර පවත්නා සම්බන්ධය හඳුනාගැනීම සඳහා අධ්‍යයනය රාශියක් සිදුකොට ඇත. සංවර්ධිත රටවල් පදනම් කොටගෙන සිදුකරන ලද එවැනි අධ්‍යයනයන් කිහිපයකට අනුව රටක ඉතුරුම් අනුපාතය සහ ආර්ථික වෘද්ධි අනුපාතය අතර ධන සහ-සම්බන්ධතාවයක්[2] පවතින

---

1. ආර්ථික වෘද්ධියක් සඳහා රටක ආයෝජන ප්‍රමාණයේ සිදුවන වර්ධනය පමණක් ප්‍රමාණවත් නොවන අතර වර්ධනය වන ආයෝජන ප්‍රශස්ත ආකාරයට බෙදා හැරීමද සිදුවිය යුතුය.

2. එක් විචල්‍යයක අගය වැඩිවීමේදී අනෙක් විචල්‍යයේ අගය ද වැඩිවන්නේ නම් එම විචල්‍ය දෙක අතර පවත්නා සම්බන්ධතාවය. ධන සහ-සම්බන්ධතාවක් (Positive Correlation) ලෙස හැඳින්වේ.